# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2165/46 - 2020 මාර්තු මස 05 වැනි බ්‍රහස්පතින්දා - 2020.03.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 19/78 (v)

**1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත**

1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 5 වන වගන්තියේ (3) වන උපවගන්තිය සමග කියවිය යුතු එම පනතේ 61 වන වගන්තිය යටතේ අධිකරණ, මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගය.

නිමල් සිරිපාල ද සිල්වා,
අධිකරණ, මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2020 මාර්තු මස 03 වැනි දින,
කොළඹ දී ය.

නියෝගය

1979 ජූලි මස 2 වන දින අංක 43/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද, කලින් කළ සංශෝධිත නියෝගය, එහි උපලේඛනයේ ''දිසා අධිකරණය'' යන ශීර්ෂය යටතේ I වන තීරයේ දැක්වෙන අම්පාර යන අයිතමයට සහ II වන තීරයේ ඇති අනුරූප සටහනට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

| ''I තීරය | II වන තීරය |
|---|---|
| දෙහිඅත්තකන්ඩිය | දෙහිඅත්තකන්ඩිය.'' |

---

එල්.ඩී.බී 19/78 (v)

**1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත**

3 වන වගන්තිය යටතේ නියමය

1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 3 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ, මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මා විසින්, අග්‍රවිනිශ්චයකාරවරයා සහ අභියාචනා අධිකරණයේ සභාපතිවරයා විමසා, මේ නියමය මඟින්, 2019 අගෝස්තු මස 20 වන දිනැති අංක 2137/40 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නියමය මඟින් සංශෝධිත 2010 නොවැම්බර් මස 10 වන දිනැති අංක 1679/40 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නියමයේ උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(i) I වැනි තීරුවේ ''අධිකරණ කලාපය'' යන ශීර්ෂය යටතේ දැක්වෙන ''26. අම්පාර'' යන සටහන සහ ඊට අනුරූපීව, ''අධිකරණ බල ප්‍රදේශය'' යන ශීර්ෂය යටතේ IV වැනි තීරුවේ දැක්වෙන සටහන් වෙනුවට පහත දැක්වෙන සටහන් පිළිවෙලින් ආදේශ කිරීමෙන් :-

| | |
|---|---|
| ''**26. අම්පාර** | අම්පාර අධිකරණ කලාපය අම්පාර, ලාහුගල සහ දෙහිඅත්තකන්ඩිය යන අධිකරණ දිසාවලින් සංයුක්ත වේ.''; |

(ii) I වැනි තීරුව යටතේ අම්පාර අධිකරණ කලාපයට අනුරූපීව, II වැනි තීරුවේ ''දිසාව'' යන ශීර්ෂය යටතේ දැක්වෙන ''1. අම්පාර'' යන සටහන සහ IV වැනි තීරුවේ ''අධිකරණ බල ප්‍රදේශය'' යන ශීර්ෂය යටතේ දැක්වෙන සටහන් වෙනුවට පහත දැක්වෙන සටහන් ආදේශ කිරීමෙන් :-

| | |
|---|---|
| ''1. **අම්පාර** | අම්පාර අධිකරණ දිසාව අම්පාර අධිකරණ කොට්ඨාසයෙන් සංයුක්ත වේ.''; |

(iii) I වැනි තීරුව යටතේ අම්පාර අධිකරණ කලාපයට අනුරූපීව සහ II වැනි තීරුවේ අම්පාර අධිකරණ දිසාවට අනුරූපීව, III වැනි තීරුවේ ''කොට්ඨාසය'' යන ශීර්ෂය යටතේ දැක්වෙන ''2. දෙහිඅත්තකණ්ඩිය'' යන සටහන සහ ඊට අනුරූපීව IV වැනි තීරුවේ ''අධිකරණ බල ප්‍රදේශය'' යන ශීර්ෂය යටතේ දැක්වෙන සටහන් ඉවත් කිරීමෙන්

(iv) I වැනි තීරුව යටතේ අම්පාර අධිකරණ කලාපයට අනුරූපීව II වැනි තීරුව යටතේ ලාහුගල අධිකරණ දිසාවට අනුරූපීව සහ III වැනි තීරුව යටතේ ලාහුගල අධිකරණ කොට්ඨාසයට අනුරූපීව ''අධිකරණ බල ප්‍රදේශය'' යන ශීර්ෂය යටතේ IV වැනි තීරුවේ දැක්වෙන ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අදාළ සටහන්වලට ඉක්බිතිව ම පහත දැක්වෙන සටහන් එකතු කිරීමෙන් :-

| | |
|---|---|
| ''3. **දෙහිඅත්තකණ්ඩිය** | දෙහිඅත්තකණ්ඩිය අධිකරණ දිසාව දෙහිඅත්තකණ්ඩිය අධිකරණ කොට්ඨාසයෙන් සමන්විත වේ. |
| 1. **දෙහිඅත්තකණ්ඩිය** | දෙහිඅත්තකණ්ඩිය අධිකරණ කොට්ඨාසය - දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි රිදී ඇල (ග්‍රා.නි.කො. අංක 142 එල්), සැලසුම්ගම (ග්‍රා.නි.කො. අංක 142එම්), කදිරපුර (ග්‍රා.නි.කො. අංක 142එන්), දෙහිඅත්තකණ්ඩිය (ග්‍රා.නි.කො. අංක 142ජේ), බක්මීදෙණිය (ග්‍රා.නි.කො. අංක 142කේ), ලිහිණියාගම (ග්‍රා.නි.කො. අංක 142එච්), මාවතගම (ග්‍රා.නි.කො. අංක 142අයි), සඳුන්පුර (ග්‍රා.නි.කො. අංක 142ඊ), සඳමඩුල්ල (ග්‍රා.නි.කො. අංක 142එෆ්), සේරුපිටිය (ග්‍රා.නි.කො. අංක 142ජී), ඉහලගම (ග්‍රා.නි.කො. අංක142ඩී), පරනගම (ග්‍රා.නි.කො. අංක 142සී), නව මැදගම (ග්‍රා.නි.කො. අංක 142බී), සහ වැව් මැදගම (ග්‍රා.නි.කො. අංක 142ඒ) යන ග්‍රාම නිලධාරී කොට්ඨාසවලින් සංයුක්ත වේ. |
| | මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි බෝගමුයාය (ග්‍රා.නි.කො. අංක 144බී/1), තෙම්පිටිය (ග්‍රා.නි.කො. අංක 145), පූලාවල (ග්‍රා.නි.කො. අංක 145ඒ), බැදිරැක්ක (ග්‍රා.නි.කො. අංක 144සී), උණුවතුර බුබුල (ග්‍රා.නි.කො. අංක 144බී), ඉද්දපොල (ග්‍රා.නි.කො. අංක 144ඒ/1), තැපැල්පොල (ග්‍රා.නි.කො. අංක 144ඩී), මහඔය (ග්‍රා.නි.කො. අංක 144), සමඟිපුර (ග්‍රා.නි.කො. අංක 136ඒ/2), බොරපොල (ග්‍රා.නි.කො අංක 136ඒ/1), කැලවින්න (ග්‍රා.නි.කො අංක 136), දඹදෙනිය (ග්‍රා.නි.කො. අංක 137ඒ/1), කැකිරිහේන (ග්‍රා.නි.කො. අංක 144ඒ), කුඩාහරස්ගල (ග්‍රා.නි.කො අංක 137ඒ/2) ලාහුගල (ග්‍රා.නි.කො. අංක 137), පොල්ලේබැද්ද (ග්‍රා.නි.කො. අංක 136බී), සහ අරන්තලාව (ග්‍රා.නි.කො. අංක 136ඒ) යන ග්‍රාම නිලධාරී කොට්ඨාසවලින් සංයුක්ත වේ. |
| | සහ |
| | පදියතලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි ගල්ඔඩේ (ග්‍රා.නි.කො අංක 141ඒ), පළතුරුවැල්ල (ග්‍රා.නි.කො. අංක 137සී), පුලුන්ගස්මුල්ල (ග්‍රා.නි.කො. අංක 137ඩී) සේරන්කඩ (ග්‍රා.නි.කො. අංක 137ඒ), උනපාන (ග්‍රා.නි.කො. අංක 141බී), හගම්වැල (ග්‍රා.නි.කො. අංක 141සී) කිරවාන (ග්‍රා.නි.කො. අංක 140සී) පදියතලාව (ග්‍රා.නි.කො. අංක 140ඒ), තලපිටඔය වම (ග්‍රා.නි.කො. අංක 140ඩී), සරනගම (ග්‍රා.නි.කො. අංක 141ඩී), පල්ලේගම (ග්‍රා.නි.කො. අංක 141), මොරදෙනිය (ග්‍රා.නි.කො. අංක 137බී) තලපිටඔය දකුණ (ග්‍රා.නි.කො. අංක 140බී), හොලිකෙ (ග්‍රා.නි.කො. අංක 138), |

කෙහෙල්උල්ල (ග්‍රා.නි.කො. අංක 140), මිරිස්වත්ත (ග්‍රා.නි.කො. අංක 138ඒ), කෝලමන්තලාව (ග්‍රා.නි.කො. අංක 138බී), දොරකුඹුර (ග්‍රා.නි.කො. අංක 139), මාරන්ගල (ග්‍රා.නි.කො. අංක 139ඒ), සහ කොමන (ග්‍රා.නි.කො. අංක 139බී) යන ග්‍රාම නිලධාරී කොට්ඨාස වලින් සංයුක්ත වේ.''.

(v) I වැනි තීරුවේ ''කලාපය'' යන ශීර්ෂය යටතේ දැක්වෙන ''2. ගම්පහ'' යන සටහන සහ ඊට අනුරූපීව, ''අධිකරණ බල ප්‍රදේශය'' යන ශීර්ෂය යටතේ IV වැනි තීරුවේ දැක්වෙන සටහන් වෙනුවට පහත දැක්වෙන සටහන් ආදේශ කිරීමෙන් :-

''**2. ගම්පහ** ගම්පහ අධිකරණ කලාපය ගම්පහ, පූගොඩ සහ අත්තනගල්ල යන අධිකරණ දිසාවලින් සංයුක්ත වේ.'';

(vi) I වැනි තීරුව යටතේ ගම්පහ අධිකරණ කලාපයට අනුරූපීව, II වැනි තීරුව යටතේ ගම්පහ අධිකරණ දිසාවට අනුරූපීව, III වැනි තීරුව යටතේ ගම්පහ අධිකරණ කොට්ඨාසයට අනුරූපීව ''අධිකරණ බල ප්‍රදේශය'' යන ශීර්ෂය යටතේ IV වැනි තීරුවේ දැක්වෙන ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ''කලොටුවාව (ග්‍රා.නි.කො. අංක 319), බෝගමුව (ග්‍රා.නි.කො. අංක 320ඒ), මංගලතිරිය (ග්‍රා.නි.කො. අංක 320), පිලන්කඩ (ග්‍රා.නි.කො. අංක 319ඒ), බෝනෙගල (ග්‍රා.නි.කො. අංක 313), ඕගොඩපොළ උතුර (ග්‍රා.නි.කො. අංක 314ඒ), ඕගොඩපොළ (ග්‍රා.නි.කො. අංක 314), කහබිලිහේන (ග්‍රා.නි.කො. අංක 312ඒ), උඩතුත්තිරිපිටිය (ග්‍රා.නි.කො. අංක 312), මත්තෙගොඩ (ග්‍රා.නි.කො. අංක 311), වීරන්ගුල (ග්‍රා.නි.කො. අංක 310), වීරන්ගුල දකුණ (ග්‍රා.නි.කො. අංක 310ඒ), කොස්කඳවල උතුර (ග්‍රා.නි.කො. අංක 308ඒ), කිරිකිත්තමුල්ල (ග්‍රා.නි.කො. අංක 309), කිරිකිත්තමුල්ල දකුණ (ග්‍රා.නි.කො. අංක 309ඒ), කොස්කඳවල (ග්‍රා.නි.කො. අංක 308), ඕපත්ඇල්ල (ග්‍රා.නි.කො. අංක 371), පරණගම (ග්‍රා.නි.කො. අංක 370), පරණගම නැගෙනහිර (ග්‍රා.නි.කො. අංක 370ඩී), රුවන්පුර (ග්‍රා.නි.කො. අංක 370බී), ගල්බොඩ (ග්‍රා.නි.කො. අංක 370ඒ), දෙමටලන්ද (ග්‍රා.නි.කො. අංක 370ඞී), මුදාගමුව (ග්‍රා.නි.කො. අංක 324ඒ), බෙම්මුල්ල (ග්‍රා.නි.කො. අංක 324), කන්දඔළුවාව (ග්‍රා.නි.කො. අංක 326), රනිස්වල (ග්‍රා.නි.කො. අංක 323), සපුගස්තැන්න (ග්‍රා.නි.කො. අංක 323ඒ), තිරිවානේගම දකුණ (ග්‍රා.නි.කො. අංක 322බී), තිරිවානේගම උතුර (ග්‍රා.නි.කො. අංක 322ඒ), මහීපාලගොඩ (ග්‍රා.නි.කො. අංක 230), මොරැන්න (ග්‍රා.නි.කො. අංක 230ඒ), වීදියවත්ත (ග්‍රා.නි.කො. අංක 230බී), ගල්තොටමුල්ල (ග්‍රා.නි.කො. අංක 230සී), කොරසෙ (ග්‍රා.නි.කො. අංක 111), කොරසෙ මැද (ග්‍රා.නි.කො. අංක 111/1), කොරසෙ නැගෙනහිර (ග්‍රා.නි.කො. අංක 111/2), වීගොඩ (ග්‍රා.නි.කො. අංක 128)'' යන වචන සහ ඉලක්කම් ඉවත් කිරීමෙන් ;

(vii) I වැනි තීරුව යටතේ ගම්පහ අධිකරණ කලාපයට අනුරූපීව, II වැනි තීරුව යටතේ ගම්පහ අධිකරණ දිසාවට අනුරූපීව, III වැනි තීරුව යටතේ ගම්පහ අධිකරණ කොට්ඨාසයට අනුරූපීව ''අධිකරණ බල ප්‍රදේශය'' යන ශීර්ෂය යටතේ IV වැනි තීරුවේ දැක්වෙන ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ''සහ ඇඹරළුව දකුණ 2 (ග්‍රා.නි.කො. අංක 242සී)'' යන වචන සහ ඉලක්කම් වෙනුවට ''ඇඹරළුව දකුණ (ග්‍රා.නි.කො. අංක 242සී), මහීපාලගොඩ (ග්‍රා.නි.කො. අංක 230), මොරැන්න (ග්‍රා.නි.කො. අංක 230ඒ), වීදියවත්ත (ග්‍රා.නි.කො. අංක 230බී), සහ ගල්තොටමුල්ල (ග්‍රා.නි.කො. අංක 230සී)'' යන වචන සහ ඉලක්කම් ඇතුළත් කිරීමෙන් ;

(viii) I වැනි තීරුව යටතේ ගම්පහ අධිකරණ කලාපයට අනුරූපීව, II වැනි තීරුව යටතේ ගම්පහ අධිකරණ දිසාවට අනුරූපීව, III වැනි තීරුව යටතේ ගම්පහ අධිකරණ කොට්ඨාසයට අනුරූපීව ''අධිකරණ බල ප්‍රදේශය'' යන ශීර්ෂය යටතේ IV වැනි තීරුවේ දැක්වෙන මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ''සහ අස්ගිරිය බටහිර (ග්‍රා.නි.කො. අංක 34/3)'' යන වචන සහ ඉලක්කම් වෙනුවට ''අස්ගිරිය බටහිර (ග්‍රා.නි.කො. අංක 34/3), කොරසෙ (ග්‍රා.නි.කො. අංක 111), කොරසෙ මැද (ග්‍රා.නි.කො. අංක 111/1), කොරසෙ නැගෙනහිර (ග්‍රා.නි.කො. අංක 111/2), වීගොඩ (ග්‍රා.නි.කො. අංක 128)'' යන වචන සහ ඉලක්කම් ඇතුළත් කිරීමෙන් ;

(ix) I වැනි තීරුව යටතේ ගම්පහ අධිකරණ කලාපයට අනුරූපීව, II වැනි තීරුව යටතේ ගම්පහ අධිකරණ දිසාවට අනුරූපීව, III වැනි තීරුව යටතේ ගම්පහ අධිකරණ කොට්ඨාසයට අනුරූපීව ''අධිකරණ බල ප්‍රදේශය'' යන ශීර්ෂය යටතේ IV වැනි තීරුවේ දැක්වෙන අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ''සහ දාරළුව (ග්‍රා.නි.කො. අංක 325බී)'' යන වචන සහ ඉලක්කම් වෙනුවට ''දාරළුව (ග්‍රා.නි.කො. අංක 325බී), කලොටුවාව (ග්‍රා.නි.කො. අංක 319), බෝගමුව (ග්‍රා.නි.කො. අංක 320ඒ), මංගලතිරිය (ග්‍රා.නි.කො. අංක 320), පිලන්කඩ (ග්‍රා.නි.කො. අංක 319ඒ), බෝනෙගල (ග්‍රා.නි.කො. අංක 313), ඕගොඩපොළ උතුර (ග්‍රා.නි.කො. අංක 314ඒ), ඕගොඩපොළ (ග්‍රා.නි.කො. අංක 314), කහබිලිහේන (ග්‍රා.නි.කො. අංක 312ඒ), උඩතුත්තිරිපිටිය (ග්‍රා.නි.කො. අංක 312), මත්තෙගොඩ (ග්‍රා.නි.කො. අංක 311), වීරන්ගුල (ග්‍රා.නි.කො. අංක 310), වීරන්ගුල දකුණ (ග්‍රා.නි.කො. අංක 310ඒ), කොස්කඳවල උතුර (ග්‍රා.නි.කො. අංක 308ඒ), කිරිකිත්තමුල්ල (ග්‍රා.නි.කො. අංක 309), කිරිකිත්තමුල්ල දකුණ (ග්‍රා.නි.කො. අංක 309ඒ), කොස්කඳවල (ග්‍රා.නි.කො. අංක 308), ඕපත්ඇල්ල (ග්‍රා.නි.කො. අංක 371), පරණගම (ග්‍රා.නි.කො. අංක 370), පරණගම නැගෙනහිර

(ග්‍රා.නි.කො. අංක 370ඞී), රුවන්පුර (ග්‍රා.නි.කො. අංක 370බී), ගල්බොඩ (ග්‍රා.නි.කො. අංක 370ඒ), දෙමටලන්ද (ග්‍රා.නි.කො. අංක 370ඩී), මුදාගමුව (ග්‍රා.නි.කො. අංක 324ඒ), බෙම්මුල්ල (ග්‍රා.නි.කො. අංක 324), කන්දඹළුවාව (ග්‍රා.නි.කො. අංක 326), රනිස්වල (ග්‍රා.නි.කො. අංක 323), සපුගස්තැන්න (ග්‍රා.නි.කො. අංක 323ඒ), තිරිවානේගම දකුණ (ග්‍රා.නි.කො. අංක 322බී), සහ තිරිවානේගම උතුර (ග්‍රා.නි.කො. අංක 322ඒ)'' යන වචන සහ ඉලක්කම් ඇතුළත් කිරීමෙන් ;

(x) I වැනි තීරුව යටතේ ගම්පහ අධිකරණ කලාපයට අනුරූපීව, II වැනි තීරුව යටතේ අත්තනගල්ල අධිකරණ දිසාවට අනුරූපීව, III වැනි තීරුව යටතේ අත්තනගල්ල අධිකරණ කොට්ඨාසයට අනුරූපීව ''අධිකරණ බල ප්‍රදේශය'' යන ශීර්ෂය යටතේ IV වැනි තීරුවේ දැක්වෙන ''(2) ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ යන ග්‍රාම නිලධාරි කොට්ඨාස වලින් සංයුක්ත වේ.'' යන වචන සහ ඉලක්කම් ඉවත් කිරීමෙන්.

නිමල් සිරිපාල ද සිල්වා,
අධිකරණ, මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2020 මාර්තු මස 03 වැනි දින,
කොළඹ දී ය.

03 - 809

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.